# ලිංගිකත්වය සහ ලිංගික අනන්‍යතාවඃ සංකල්පීය මායිම් පිළිබඳ විග්‍රහයක්

ජයප්‍රසාද් වෙල්ගම


## සංක්ෂිප්තය

සමාජ ගත මිනිසා යනු අත්‍යවශ්‍යයෙන් ම ස්වභාව ධර්මයේ සහ සංස්කෘතියෙහි සංකලනයකි. මිනිසා තම කායික මානසික අවශතා, සමාජ භෞතික පරිසරය තුළ ඉටුකර ගන්නා ආකාරය අනුව ඔහු හෝ ඇය ගේ සංස්කෘතිය තීරණය වේ නම්, මානව ලිංගිකත්වය ද සමාජ සංස්කෘතික ප්‍රපංචයක් වීම ව්‍යතිරේඛයක් නොවේ. අතිමහත් සංස්කෘතික විවිධත්වය මෙන්ම ගෝලීකරණය තුළ ප්‍රබල වූ සංස්කෘතික සම්මිශ්‍රණ ප්‍රවණතාව යන පසුබිම මත ලිංගිකත්වය සහ ලිංගික අනන්‍යතාවය යන සංකල්පයන්හි සීමා මායිම් ශාස්ත්‍රීය වශයෙන් විමසීම කාලීන අවශ්‍යතාවක් වනුයේ ලිංගිකත්වය සුවිශේෂයෙන් ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ ආවෘත මාතෘකාවක් බැවිනි. ජීව විද්‍යාත්මක පදනමක් මත, අතිශයින්ම සමාජ සංස්කෘතික වූ නිර්මාණයක් ලෙස ලිංගිකත්වය සහ ලිංගික අනන්‍යතාවයන් ඉස්මතු වන්නේ කෙසේ ද යන්න ලිංගිකත්වය පිළිබඳ ව ඇති ප්‍රමුඛ දැනුම් භාණ්ඩයන් වන ඓතිහාසික, ජීව විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක පර්යාවලෝකයන් සංකලනය ඔස්සේ විමසීම මෙම ලේඛනය මතින් අපේක්ෂා කෙරේ. මෙම ශාස්ත්‍රීය විමර්ශනය ද්විතියික මූලාශ්‍ර මත පමණක් පදනම්ව සිදුවිය. ලිංගිකත්වය සහ ලිංගික අනන්‍යතාවයන් හි හැඩතල කාලය හා අවකාශය අතර වෙනස් වන සමාජ ගතිකයන්ගේ නිර්මාණයන්ය. වියැකී යන සාම්ප්‍රදායික අනන්‍යතාවයන් වෙනුවට නව අනන්‍යතාවයන් බිහි කොට ගැනීමේදී ලිංගිකත්වය තීරණාත්මක සාධකයක්ව ඇත.


බහුවිධවූ පැතිකඩ නිසාවෙන්ම ලිංගිකත්වය යන සංකල්පය දුරවබෝධය පිණිස හේතු විය හැක. එය හුදෙක් නූතනය මතින්වූ නිර්මිතයක් නොවේ. විවිධ මානව ශිෂ්ටාචාරයන් තුළ විසූ මිනිසුන්ගේ පුද්ගලික සහ සාමාජීය උත්සාහයක් ලෙස ඓතිහාසික වශයෙන් ලිංගිකත්වය එහි සංකල්පමය නිම්වලලු පුළුල් කරගන්නා

ලදී. වාස්තවිකවාදී (Positivist) ප්‍රවේශයක් ලද පළමු ලිංගික විද්‍යාඥයා වශයෙන් සලකනු ලබන ඇල්ප්‍රඩ් කින්සිට අනුව 'මානව චර්යාවට අදාලව වඩාත් සිතිවිලි ලෙස එළිදකින, කථාබහට සහ ග්‍රන්ථකරණයට ලක්වූ ලිංගිකත්වය හා සමාන වෙනත් කාරණයක් නොමැත'(වීක්ස් 1986: 89). ලිංගිකත්වය මිනිස් ජීවිතයට තුළට අරුතක් එකතු කරනු පමණක් නොව එය අත්‍යන්තයෙන් ම ස්වභාවිකවුත් මිනිසා සහ ඔහුගේ සමාජීය ජීවිතය පිළිබඳ සත්‍යයකි. ලිංගිකත්වය වැඩිමනතම උගත් චින්තාවක් සහ චර්යාවක් වන අතර ඓතිහාසික වශයෙන් පරිණාමය වෙමින් මානව අනන්‍යතාවන් නිර්මාණය පිණිස මානව පෞරුෂය තුළට අභ්‍යන්තරීකරණය වන දැනුමක්ද වේ. මෙම ලේඛනයෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ ඡන්‍දයක් බඳු ලිංගිකත්වය නම් සංකීර්ණ සංකල්පයෙහි සීමා මායිම් සහ එහි ලා අන්තර්ගත සෙසු සංකල්පීය උපාංගයන් බහුවිධ වූ පර්යාලෝකයන් මතින් විමසීම ය. ඓතිහාසික සහ හරස් සංස්කෘතිකමය වශයෙන් ලිංගිකත්වය සහ ලිංගික අනන්‍යතාවයන් වෙනස්වන ආකාරයද සැකෙවින් විමසීම මෙමගින් අපේක්ෂිතය.

## 1. ලිංගිකත්වය පිළිබඳ අර්ථකථනය

ලිංගිකත්වය පිළිබඳ සර්ව සාධාරණ අර්ථකථනයක් ඉදිරිපත් කළ හැකිද යන්න සංකල්පය තුළින්ම මතුවන ගැටළුවකි. කෙසේ වෙතත් ලිංගිකත්වයෙහි සීමා මායිම් නිර්ණය පිණිස බොහෝ උත්සාහයන් පැවතී ඇත.

ඉතා සරළාර්ථයෙන් ක්‍රෝගර්(2000) විසින් අර්ථකථනය කරන පරිදි ලිංගිකත්වය වනාහී ලිංගික ක්‍රියාවන් සඳහා පුද්ගලයාගේ සහභාගීත්වයත් ඒ සඳහා ඔහු හෝ ඇය තුළ වන අභිරුචියත්ය. එහෙත් ලිංගිකත්වය හා සබැඳුනු ජීව විද්‍යාත්මක සහ සාමාජීය යථාර්ථය මෙම අර්ථකථනයෙන් ප්‍රමාණවත්ව නිරූපනය නොවේ. සාර්ථක අර්ථකතනයක් වේද එය මෙම සංකල්පය හා බැඳුනු ජීව විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක සහ සංස්කෘතිකමය සංඝටකයන් නියෝජනය කළ යුතුය. අන්තර්ජාලය ආශ්‍රිතව ප්‍රචලිත විකිපීඩියා විශ්වකෝෂයට (http://en.wikipedia.org/wiki/Sexuality:15.06.2008) අනුව 'මානව ලිංගිකත්වය යනු ලිංගික හැඟීම් ප්‍රකාශනය, ඒ හා සබැඳි මානව සම්බන්ධතා සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කොට තම අනන්‍යතාවය ප්‍රකාශ කිරීමය. මෙම අර්ථකථනය සංකල්පය තුළ වන

සංකීර්ණභාවය යම්තාක් දුරට අමතයි. ලිංගික අනන්‍යතාවය පසුබිම් කොටගත් ලිංගික හැඟීම් ප්‍රකාශනය අර්ථකථනය තුළ වෙසෙසා ඇත.

ලිංගිකත්වය සමාජ විද්‍යාත්මක වශයෙන් විවරණය පිණිස දායක වූ කීර්තිමත් විද්‍යාර්ථියකු වන ජෙෆ්රි වික්ස්, සංකල්පයෙහි සංකීර්ණ බව මැනවින් තම අර්ථකථනය තුළ ගැබ් කොට ඇත.

> ඓතිහාසික නිර්මාණයක් වන ලිංගිකත්වය අන්‍යෝන්‍ය වශයෙන් බහිස්කාරක වූ විවිධ ජීව විද්‍යාත්මක සහ මානසික හැකියාවන්, එනම් ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය, ශාරීරික වෙනස්කම්, ප්‍රජනක හැකියාවන්, ලිංගික අවශ්‍යතා, අභිරුචිය සහ චිත්තරූපයන්හි සංකලනයකි. ලිංගිකත්වයෙහි සියළු නිර්මාණාත්මක උපාංගයන්හි මූලය ශරීරය හෝ මනස තුළ වන අතර ඒවා අර්ථවත් වනුයේ සාමාජීය සම්බන්ධතාවයන් තුළ පමණි (වික්ස් 1986 :15).

ඉහත අර්ථකථනය තුළ සුවිශේෂියත්වය වනුයේ ලිංගිකත්වය සාමාජීය නිර්මිතයක් ලෙස දැක්වීමය. අප ලිංගිකය ලෙස හඳුන්වන්නෙහි හැඩරුව ජීව විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක සහ සංස්කෘතිකමය මූලිකාංගයන්හි නිරන්තර අන්තර් සම්බන්ධය මතින් තීරණය වේ. එහෙයින් ලිංගිකත්වය සමාජමය නිර්මාණයක් පමණක් නොව ජීව විද්‍යාත්මකව වෙනස් වූ ශරීරයන් තුළ පැන නගින ජීව විද්‍යාත්මක බලවේගයක් ලෙසත් ආශාව සහ චිත්තරූප පදනම් කොටගත් මනෝමූලික වූ යථාර්ථයක් බවත් පැහැදිලි වේ.

මානව ලිංගිකත්වය අවබෝධයෙහි ලා වැදගත්වන ජීව විද්‍යාත්මක කරුණු කිහිපයක් රෙනිෂ් සහ බිස්ලේ පෙන්වා දෙයි. ස්ත්‍රී පුරුෂ භාවය තීරණය කරණ වර්ණදේහ එනම් එහිදී වැදගත්වන ජානමය ද්‍රව්‍ය (chromosomal sex), ලිංගික අභිප්‍රේරණය පිණිස හේතු වන අන්තරාසර්ග පද්ධතිය (grandular system) මගින් මුදාහරිනා හෝර්මෝන, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව සහ පුද්ගලයාගේ ලිංගික දිශානතිය (sexual orientation) මානව ලිංගිකත්ව වර්ධනයෙහි ලා තීරක සාධක වේ (උපුටා දක්වන්නේ, බිලිංටන් 1998: 87). මිනිසාට මෙන්ම අන්‍ය සෑම සත්ව විශේෂයකටම පරිණාමීය වශයෙන් උරුමවන ජීව විද්‍යාත්මක පදනම හැරුණු විට ලිංගිකත්වය නම් සංකල්පය සතු අන් සියළු උපාංග කාලානුරූප වූ සමාජ

නිර්මිතයන්ය. මිනිසුන් ගැහැණු සහ පිරිමි වශයෙන් සමාජය විසින් බෙදා දැක්වීම අප සන්තානයන් තුළ ඇති සමාජ විඥ්ඥානය ද්විධාකරණය (dichotomy) කරවයි. එහෙත් ලිංගභේදය ජීව විද්‍යාත්මක වශයෙන් ගත් කල්හි ඉතා බලවත් මෙන්ම ස්ථිතික ජීව විද්‍යාත්මක උපක්‍රමයකි. යටත් පිරිසෙයින් මෙම ජීව විද්‍යාත්මක පදනම මත සිට හෝ ගැහැණුන් ගැහැණු ලෙසත්, පිරිමින් පිරිමි ලෙසත් දැකීමට සංස්කෘතිකමය පෙළඹවීමක් පවතී.

වික්ස් (1986: 13) විසින් පෙන්වා දෙන තවත් යතාර්ථයක් නම් ලිංගික චර්යාව හා බැඳුනු පිරමිඩාකාර ස්වරූපයක්, එනම් ලිංගික ධූරාවලියක් පවතින බවය. ලිංගික චර්යාවන් කොතෙක් දුරට සමාජය අනුමත කරයිද නැතහොත් අපගාමීත්වයෙහි ලා සලකයි ද යන කාරණය මත ඉහළ සිට පහළට යොමුවූ අනුපිළිවෙළකට සැකසී ඇත. අන්‍යයන්ට සාපේක්ෂ වශයෙන් සමාජය තුළ ස්ථානගත වෙමින් පුද්ගලයා ලිංගික ශරීරය සහ ඒහා බැඳුනු මානසික ආවේග ප්‍රකාශනය මතින් තම ලිංගික සමාජ ආත්මයෙහි (sexual self) හැඩරුව හඳුනාගනී. සැබැවින්ම ස්වභාවධර්මයෙහි (nature) සහ සංස්කෘතියෙහි සම්මිශ්‍රණයක් ලෙස ලිංගිකත්වය සහ ලිංගික අනන්‍යතාව වර්ධනය බුද්ධිමය කුතුහලයට ගෝචරවූ කරුණකි.

## 2. ලිංගිකත්වය, ඉතිහාසය සහ සමාජ නිර්මාණය

ඓතිහාසික වශයෙන් නිර්මාණය වූ සමාජ යථාර්තයක් ලෙස ලිංගිකත්වය පිළිබඳ අර්ථකථන මිණුම් දඬු කොටගත් කල්හි ඉපැරණි මානවයාට ලිංගිකත්වයක් පැවතුනිද යන්න ගැටලු සහගතය. අප ලිංගිකත්වය ස්වභාව ධර්මයේ ප්‍රජනක යාන්ත්‍රනයක්ය යන තර්කයට ලඝු කළ හොත් ලිංගිකත්වයේ ඉතිහාසය යනු මානව සංහතියේ ඉතිහාසයද වන්නේය. ලිංගිකත්වය (sexuality) යන වචනය යුරෝපීය සහ ඇමෙරිකානු මානව විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක සාහිත්‍යය තුළට ඇතුළත් වනුයේ 19 වන සියවස තරම් මෑත ඉතිහාසය තුළදීය. වසර 1836 දී ඔක්ස්ෆෝඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂය තුළට ලිංගිකත්වය යන වදන ඇතුළත් විය (බ්‍රිස්ටෝ 1997: 31).

ලිංගිකත්වයෙහි ඉතිහාසය පිළිබඳ විමර්ශනය, ආදි මානවයාගේ ලිංගික චර්යාව සංවිධිත ලෙස හෝ අහඹු ලෙස සහකරුවන් කිහිපදෙනෙක් හෝ එක් සහකරුවෙකු සමග පමණක් සිදුවීද යන ගැටළුව නංවයි. දඩයම් හා එලවැල රැස්කරන්නන්ගේ (hunting and gathering) යුගයේ සමාජ තුළ ඉතා ළිහිල් සහ අහඹු ලෙස තම

කණ්ඩායම තුළින්ම තෝරාගත් සහකරුවන් සමග ලිංගික සබඳතා සිදුවූ අතර එවකට පුද්ගලයාගේ ලිංගික චර්යාව පාලනය පිණිසද පැවත ඇත්තේ ඉතා සුළු වාරණයන් පමණි. එම සමාජයන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ලිංගිකත්වයෙහි උපාංගයක් වශයෙන් විමසතොත්, මුල් මානව පවුල් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී වශයෙන් වන බෙදීම අවම මට්ටමක පවතී (කොලින්ස් සහ කෝල්ට්‍රේන් 1993). නමුත් මානව පවුල් තුළ පැවති මෙම සරල ලිංගික සංවිධානය වැඩිකලක් පැවති බවක් නොපෙනේ. පුද්ගලික දේපල ඉස්මතු වුනු ගෙවතු වගා (elementary horticulture) සහ එඬේර යුගවලට (nomadic pastoralism) සමගාමීව මිනිසුන්ගේ ලිංගික සංවිධානයෙහි යම් වෙනස්කම් ඇතිවිය. උදාහරණ වශයෙන් එක් සහකරුවකුට සීමාවීම පිළිබඳ නැමියාව සහ බහිර්ජනය (exogamy) පදනම මත සහකරුවන් තෝරා ගැනීම ඇරඹීම සැලකිය හැක. මෙයට අමතරව ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන් ද ගතික සමාජ ව්‍යුහයන් සමග වෙනස්විය.

සමස්ථ මානව ඉතිහාසය තුළම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කොටගත් උපරිම අසාමානතාව වාර්ථාවනු යේ කෘෂි සමාජ (agrarian societies) තුළය (කොලින්ස් සහ කොල්ට්‍රෙන් 1993). බොහෝවිට වත්මන් ලිංගිකත්වය පිළිබඳ කථිකාව තුළ පවතින බලවත් සහ යටහත්, ප්‍රගල්භ (assertive) සහ ප්‍රතිග්‍රාහක (receptive) ස්ත්‍රී පුරුෂ භූමිකා මෙම සමාජ පසුතලය තුළ නිර්මාණය වුවා යැයි සිතිය හැක.

මානව ලිංගිකත්වයෙහි ඉතිහාසය ඒ පිළිබඳව පවතින නූතන සංස්කෘතික මිණුම් දඬු මගින් විමසීම තුළින් සිදුවන අවැඩ පිළිබඳව පුරෝගාමී මානව විද්‍යාඥයින් වන මැලිනොවුස්කි සහ මාගරට් මීඩ් සඳහන් කරයි (වික්ස් 1986 :22). මානව විද්‍යාත්මක හෝ සමාජ විද්‍යාත්මක පර්යාලෝක බොහෝ සෙයින් ම ලිංගිකත්වය හුදු එක් සම්මුතිගත ස්වභායක් සේ නොසලකයි. ආර්ථික අතිරික්තය (economic surplus) නැමැති සාධකය කරණ කොට ගෙන සමාජය තුළ බලය හිමි කොටස් ලද විවේකය සංස්කෘතිකාංග ප්‍රතිනිර්මාණය කරණු පිණිස යොදා ගැනින. මෙහිදී මිනිසාගේ ලිංගික ක්‍රියා හා බැඳුනු සංස්කෘතිකාංග ව්‍යතිරේකයක් නොවුනු අතර එය මිනිසුන්ගේ නොනිමි කුතුහලයට සහ විමසීමට පාත්‍ර විය. සුවිශේෂයෙන්ම උසස් සමාජයට (high society) අයත් පිරිස් ලද විවේකය සහ සාන්තුෂ්ඨිකවාදී ප්‍රවණතා මත ලිංගික සම්භෝගයෙහි අරමුණ ප්‍රජනනයට පමණක් සීමා නොවේ.

මධ්‍යධරණී යුරෝපා සංස්කෘතික ඉතිහාසය තුළ සිට ලිංගිකත්වයෙහි අරුත විකාශනය වූ අදියර තුනක් පිළිබඳව වීක්ස් (1986) සඳහන් කරයි. ක්‍රිස්තු පූර්ව පළමුවන සියවස තුළදී ලිංගිකතාවයෙහි මූලික අරමුණ වූයේ ප්‍රජනනය නමුදු එය අනන්‍යන්තයෙන්ම ශාරීරිකව ලබන සතුටෙහි මූලාශ්‍රයක් බව සැලකිණ. විවාහයට පරිභාහිර ලිංගික චර්යාව සතුට ගෙන දෙන්නක් සේම පාපයක් ලෙස වටහා ගැනින. දෙවනුව ක්‍රිස්තු වර්ෂ 12, 13 සියවස් තුළ පැහැදිළිව විද්‍යමානවන්නක් නම් ආගමික ප්‍රතිමාන මගින් ගිහි (secular) බව දැඩිසේ පාලනය කරමින් උග්‍ර ලිංගික සදාචාරයක් සමාජය තුළ ස්ථාපනය කිරීමය. විශේෂයෙන් ක්‍රිස්තියානි සම්ප්‍රදාය විසින් විශම ලිංගිකත්වයට (heterosexuality) පදනම් කොට ගත් විවාහය දැඩි ලෙස සාධාරණීකරණය කරයි. තෙවනුව 18 සහ 19 සියවස් තුළදී විෂම ලිංගිකත්වයට පරිභාහිර ඕනෑම ලිංගිකත්වයක් අපගාමීත්වයෙහි සලකා ලිංගික වශයෙන් සාමාන්‍ය සහ අසාමාන්‍ය වශයෙන් තියුණු බෙදීමක් නිර්මාණය වේ. එහෙත් මේ වන විට ලිංගිකත්වය ඓහිකරණයට (secularzation) ලක්වෙමින් පැවතිණ.

කෙසේ වෙතත් අප වටහා ගත යුත්තක් වනුයේ බොහෝ මානව ශිෂ්ටාචාර තුළ යථාර්ථයක්ව පැවතියද ලිංගිකත්වයෙහි පරිණාමය කාලය සහ සමාජ, භූගෝලීය අවකාශය තුළ එකම ස්වරූපයකින් සිදුවී නොමැති බවයි. තොරතුරුවල විශ්වාසනීයත්වය පිළිබඳ ගැටලුවක් පැවතියද නොක්ස් (1681) ශ්‍රී ලංකාව පිළිබඳව ලියූ සුප්‍රකට ග්‍රන්ථයෙහි දක්වා ඇත්තේ එවකට දිවයිනෙහි ඉතා ලිහිල් ලිංගික සදාචාරයක් පැවති බවත් විවාහයට පරිභාහිර ලිංගික සබඳතා පැවතුනු බවත්ය. පන්සිය පනස් ජාතකය විමසන කල්හිද පැවති විවාහයට පරිභාහිර සබඳතා සහ ඒවා පාලනය පිණිස ආගමික සම්ප්‍රදාය ගත් ප්‍රයත්නය මැනවින් පසක් වේ. සතරවන සියවසට අයත් හින්දු ලේඛනයක් වන කාම සූත්‍රය සහ චීන තාවෝ ලේඛණ මගින් ද එක් අතකින් විශම ලිංගිකත්වයෙහි බුද්ධි අධිකාරිමය (hegemony) ස්වභාවයත් අනෙක් අතට ලිංගිකත්වය සන්තුෂ්ඨියෙහි ප්‍රබල මූලාශ්‍රයක් බවත් පෙන්වා ඇත (හෝක්ස් 1996). මර්ඩොක් නැමති සුප්‍රකට මානව විද්‍යාඥයා පෙන්වා දෙන පරිදි සෑම සමාජයක්ම මුහුණ දෙන ගැටළුවක් වන්නේ තම සාමාජිකත්වයෙහි ලිංගිකත්වය ප්‍රකාශනය පාලනය කිරීමය (උපුටා දක්වන්නේ, බ්‍රිතාන්‍ය විශ්වකෝෂය 1991).

ඉතිහාසය තුළ ඇතැම් සමාජ සංස්කෘතික වටපිටාවන් තුළ පිළිගත් මෙන්ම නොපිළිගත් ලිංගිකත්වයන් කෙටියෙන් හෝ විමසා බැලීම මෙහිලා වැදගත්වේ.

මුල් ක්‍රිස්තියානි සමය තුළ කාම සුවය පාපයක් ලෙස සැලකුණු අතර එය දිව්‍ය ලෝකය තුළ නොපැවතුන, අමනුෂ්‍යයන් විසින් නිදන මනුෂ්‍යයන් ලිංගික සංසර්ගයට යෙදවීමෙහි ප්‍රතිඵලයක් ලෙස ද සලකනු ලැබීය (බ්‍රිතාන්‍ය විශ්වකෝෂය 1991). ලිංගික කටයුතු කෙරෙහි විරෝධී වූ තත්ත්වයක් ඉතිහාසය තුළ වාර්තාවනුයේ ක්‍රිස්තියානි ආගම තුළ පමණක් නොවේ. කාම සැපත හා අධ්‍යාත්මික සුවය අතර පැහැදිලි ධ්‍රැවීකරණීය (polarization) වාද මේ පසුබිම මත පවතී. වරෙක යම් සමාජ පසුතලයක ඉහලින් පිළිගත් ලිංගිකත්වයක් පසුකාලීනව හෝ සමකාලීන වෙනත් සංස්කෘතික පසුබිමක් තුළ සමාජමය වශයෙන් හෙළා දැකීමට හෝ පිළිකුළට භාජනය වී ඇත. උදාහරණයක් වශයෙන් ක්‍රිස්තු පූර්ව පස් වන සියවසට අයත් ග්‍රීක රෝමානු ලිංගික සදාචාරය තුළ අනිවාර්ය විෂමලිංගිකත්වයක් (compulsory heterosexuality) නොපැවතින. ශික්ෂණයෙහි එක් පිළිවෙතක් ලෙස නවයොවුන් වියේ තරුණයෙක් සහ වැඩිමහළු පිරිමියෙක් අතර ඇතිවන සමලිංගික සබඳතාව ආයතනගත ස්වභාවයකින් පැවතින.

ගොම්බ්‍රිච් සහ ඔබේසේකර (1998) නිර්මාණය කරනා අදහසක් නම් බ්‍රිතාන්‍ය යුගයේ යටත් විජිත ශ්‍රී ලංකාව තුළ සිංහල බෞද්ධ ලිංගික සදාචාරයෙහි වෙනසක් ඇතිවීමට අනගාරික ධර්මපාලතුමා විසින් බ්‍රිතාන්‍ය වික්ටෝරියානු සම්ප්‍රදායෙහි ආභාෂයෙන් බිහිකළ සදාචාරය බලපෑ බවයි. විශේෂයෙන් කාන්තාවන්ගෙන් උග්‍ර ලිංගික සදාචාරයක් අපේක්ෂා කිරීම මෙහිලා කැපී පෙනෙන තත්ත්වයකි.

පශ්චාත් නූතනවාදී චින්තකයකු වන ෆූකෝ ලිංගිකත්වය සමාජමය නිර්මාණයක්ය යන න්‍යායාත්මක ප්‍රවේශය පෝෂණය පිණිස කටයුතු කරයි.

> ලිංගිකත්වය දැනුම විසින් ක්‍රමිකව හෙළිදරව් කිරීමට උත්සාහ දරනා අපැහැදිලි අවකාශයක් ලෙස හෝ යම් බලයක් විසින් රඳවාගනු ලැබූ ස්වාභාවික දායාදයක් හෝ නොවිය යුතුය. ලිංගිකත්වය යැයි පැවසිය හැක්කේ ඓතිහාසික නිර්මිතයකටය (ෆූකෝ 1979: 105).

මීට සමාන අදහසක් වන්නේ එය පවත්නා සමාජ අවකාශය තුළ මිස ලිංගිකත්වයට අරුතක් නොමැති බවයි (ප්ලමර් උපුටා දක්වන්නේ, වීක්ස් 1986: 54). මෙම ප්‍රකාශන විසින් මානව ලිංගිකත්වය නිර්මාණයෙහි ලා ස්වභාවධර්මයේ භූමිකාව සුළු කොට දක්වයි. ඔවුන් දකිනා ආකාරයට ඇත ඉතිහාසය තුළ ලිංගික යැයි යමක් නොතිබුනු අතර සාමාජීය වශයෙන් සිදුවූ ලේබල් කිරීම එහි හැඩරුව නිමවා ඇත.

දහඅට සහ දහනවය සියවස්හිදී විද්‍යාත්මක සහ කාර්මික විප්ලවයෙහි ප්‍රතිඵල ලෙස ඇතිවූ මහා සමාජ පරිවර්තනය ලිංගිකත්වය තුළට සුවිශේෂ අරුතක් එක් කළේය. නිෂ්පාදන ක්‍රමයෙහි (mode of production) ඇතිවූ වෙනස් වීම් සමාජ සම්බන්ධතා ව්‍යුහයන්ද වෙනස් කරවිය. මේ පසුබිම තුළ ලිංගිකත්වය බලගතු වූ ලෞකික බුද්ධි අධිකාරීන්ගේ ග්‍රහණයට ලක්ව අර්ථ නිරූපනය විය. කාර්මික නිෂ්පාදන ක්‍රමයෙහි පූර්ව අවශ්‍යතාවක් ලෙස භූගෝලීය වශයෙන් ජංගමවූ කුඩා පවුල් ඒකක බිහිවිය (ස්ටීල් සහ වොරන් 2001). ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය හා අතිනත ගත් ධනවාදී චින්තනය තුළ බොහෝ සමාජ සම්ප්‍රදා හා පොර බැදමින් සිටි ලිංගිකත්වයෙහි පරිණාමය අවබෝධයෙහි ලා මෙම යථාර්ථය වැදගත්වේ. කාර්මීකරණයත් සමග මතු වන සමාජ පසුතලය තුළ ලිංගිකත්ව පිළිබඳව බ්‍රිස්ටෝ (1997:46) සඳහන් කරන පරිදි, ලිංගික සදාචාර පද්ධතියක් තුළ රැදී සිටිනවාද නැතහොත් ඉන් විතැන් වෙනවාද යන්න පිළිබඳව තෝරා ගැනීමේ අවකාශයක් එතෙක් නොපැවති අතර, ඒ වෙනුවට අනුක්‍රමිව අඩු හෝ වැඩි සමාජ පිළිගැනීමට ලක්වූ ලිංගිකමය තෝරාගැනීම් සමුච්චයකට පුද්ගලයා යොමුවේ. කවර ස්රූපයක් වුව ලිංගිකත්වයට එරෙහි සමාජ ප්‍රතිරෝධය කාලය සහ අවකාශය අතර වෙනස් වේ. නගරබද කාර්මික සමාජය තුළ ස්ථිර ශ්‍රම සැපයුමකට පූර්ව අවශ්‍යතාවක් වශයෙන් විෂම ලිංගික න්‍යෂ්ඨික පවුල කෘත්‍යවාදීන් විසින් සාධාරණීකරණය කෙරිණ. රිච් විසින් අනිවාර්ය විෂම ලිංගිකත්වය නම් පදය හඳුන්වා දුන් අතර විෂම ලිංගික්යින් කෙරෙහි ලිංගික ආශාව හුදු කැමැත්ත හා සමානවම් සමාජමය බලවේග විසින් පනවන ලද තත්ත්වයකි (බිල්ටන් 1996: 225). ලිංගිකත්වය සමාජමය වශයෙන් නිර්මාණයෙහි ලා විවිධ අධ්‍යයන විනයන් සහ බලය සපිරි වෙනත් සමාජ ආයතන අතර ඇතිවන සම්බන්ධය ෆූකෝ විසින් විග්‍රහයට ලක් කරයි.

ෆූකො විසින් ලිංගිකත්වය කෙරෙහි සිය ස්ථාවරය The Birth of the Prison (1977), Archeology of Knowledge (1972), සහ වෙළුම් තුනකින් යුත් History of Sexuality යන කෘතීන්හි දක්වන පරිදි ලිංගික වශයෙන් 'සාමාන්‍ය' හෝ 'අසාමාන්‍ය' චර්යා හෝ තත්ත්ව, බලය සහිත සමාජ කණ්ඩායම් ඒවා අර්ථකථනය කරන ආකාරය අනුව රඳා පවතී. එබඳු බලය සහිත ආයතන මිනිස් ශරීරයන් පාලනය කරයි. ඔහුට අනුව ලිංගිකත්වය බහුවිධ පැතිකඩ ඇති සමාජ ප්‍රපංචයක් වනුයේ ඒ පිළිබඳව වන කථිකාව සමාජ ආයතන, නීති, වාරණ, පරිපාලනමය විවිධාන, විද්‍යාත්මක ප්‍රකාශන, වාස්තු විද්‍යාත්මක වෙනස් කම්, සදාචාරය ඈ සියල්ල ඇසුරු කොට

පවත්නා බවයි. ඉහත සියල්ලෙහි සංකලනයක් ලිංගිකත්වය අරුත් ගන්වයි. මේ අයුරින් විමසන කල්හි ලිංගිකයෙහි අරුත අනුක්‍රමයෙන් වඩා සංකීර්ණව පවත්නා බව වැටහේ. ඉහත තර්කයෙන්ම ව්‍යුත්පන්න වන සත්‍යයක් වනුයේ කාමීත්වය නැතහොත් ශෘංගාරය (eroticism) සමාජ අසමානතාවය (social inequality) හා බැඳී පවත්නා බවය. අඩු හෝ වැඩි වශයෙන් බලය, වරප්‍රසාද හිමි සහ අහිමි ස්ත්‍රී පුරුෂ සමාජ භාවයන්, සමාජ පන්ති, වර්ග ලිංගිකත්වය තුළ බල සබඳතා විග්‍රහයෙහි ලා සම්බන්ධ කළ හැක (බ්‍රිස්ටෝ 1997: 169-172).

ගැග්මන් සහ සිමොන් විසින් ගොඩ නගන ලද ලිංගික මාර්ගෝපදේශය (sexual scripts) නම් සංකල්පය විමසා බලමු. නිවැරදි ලිංගික චර්යාව සහ ලිංගික හමුවීම් පාලනය උදෙසා සංස්කෘතිය මගින් සපයන මාර්ගෝපදේශය මෙහි අර්ථය වේ. (බිල්ටන් 1996: 224). ඒ ඒ අවස්ථාවලදී ගැහැණු සහ පිරිමි හැසිරිය යුතු අයුරු නිශ්චය කරනු ලබන සංජානන හා අත් දැකීම් සමූහය ලිංගික මාර්ගෝපදේශය ලෙස සමාජ විද්‍යාව පිළිබඳ ශබ්ද කෝෂය දක්වයි. සෑම සංස්කෘතියක්ම මෙලෙස ලිංගික චර්යා සඳහා අත්වැලක් සපයන අතර එය සමාජානුයෝජන ක්‍රියාවලිය මතින් සිදුවන්නකි. ඉහත සාකච්ඡා කරන ලද කරුණු මෙන්ම මතු සඳහන් ලිංගිකත්වය හා බැඳුනු සංස්කෘතිකමය විවිධත්වය මගින් ද තහවුරුවන්නේ ලිංගිකත්වය අතිශයින්ම සමාජ සංස්කෘතික නිර්මාණයක් බවයි.

## 3. ලිංගිකත්වය සහ සංස්කෘතික විවිධත්වය

පෙර සඳහන් කළ පරිදි, ලිංගික වශයෙන් නිවැරදි හෝ වැරදි, අනුමත හෝ වාරණයට ලක්වන දෑ කාලය සහ අවකාශය අතර වෙනස් වේ. පවත්නා පර්යේෂණාත්මක දැනුමට අනුව ප්‍රධාන කොට පවත්නා ලිංගික දිශානතිය (sexual orientation) විෂමලිංගිකත්වය වුවත්, ඇතැම් සමාජයන්හි විෂමලිංගිකත්වය තුළ පිළිගැනෙන ඇතැම් තත්ත්ව තවත් සමාජයක වාරණය වේ. ඇතැම් සංස්කෘතීන්හි පුද්ගල ජීවන චක්‍රය පුරාම මෙබඳු වාරණ එකසේ බලපවත්වන්නේ නැත (එම්බර් සහ එම්බර් 1993: 301-303). ස්මිත් සහ බොන්ඩ් දක්වන පරිදි එක් පසුබිමක සම්පූර්ණයෙන් නිවැරදි සහ සාමාන්‍ය යැයි පිළිගන්නා චර්යාව වෙනත් සංස්කෘතික කණ්ඩායමක් තුළ කම්පනය ගෙන දෙන සුළු විප්‍රකාරයක් ලෙස දිස්විය හැක (බැරන් සහ බ්‍රයින් 1995).

එහෙයින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා සහ එම අනන්‍යතාපද සමාජ නිර්මාණයක්ම වන්නේය.

සුප්‍රකට මානව විද්‍යාඥවරියක වන මාගරට් මීඩ් විසින් රචිත, Sex and Temperament in Three Primitive Cultures නම් කෘතිය තුළ ස්ත්‍රී පුරුෂ සමාජ භාවයන් නිර්මාණයෙහි ලා මූලික මිනිස් ස්වභාවයෙහි ඇති ප්‍රත්‍යස්ථභාවය පෙන්වා දෙයි. ඇය පෙන්වා දෙන පරිදි අරපෙෂ් ප්‍රජාව තුළ වඩා ප්‍රමුඛව ඉස්මතු වන ස්ත්‍රී හෝ පුරුෂ භූමිකා නොමැත. මුණ්ඩුගුමෝර් සමාජය තුළ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය තුළම පැවතුනු කලහකාරී ස්වභාවයක් ද, චාම්බුලි සමාජය තුළ ගැහැණුන් ස්ත්‍රීපුරුෂභාවී වශයෙන් ප්‍රමුඛ පිරිමි ලක්ෂණ දරණ ආකාරය සහ එම සමාජය තුළම පිරිමි චිත්තවේගීය වශයෙන් යැපෙන සුළු ඊනියා ගැහැණු ලක්ෂණ දරණ ආකාරයෙන් දක්වා ඇත (මීඩ් 1935: 279-280). ලිංගිකත්වයෙහි උපාංගයක් ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමාජීය වශයෙන් නිර්මාණය වන බවට මෙය කදිම උදාහරණයකි. ධනවාදී පසුබිමක් තුළ පවත්නා නූතන සමාජ පර්යාය සාධාරණීකරණය කරමින් ඇතැම් කෘත්‍යවාදී සමාජ විද්‍යාඥයින් පවසන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී බෙදීම මානව පවුල කාර්යක්ෂමව පවත්වාගෙන යාමට ඉවහල් වන ඉතා ස්වභාවික තත්වයක් බවයි. සමාජය තුළට නව සාමාජිකයන් උත්පාදනය කොට උරුම කරනු වස් මෙම බෙදීම අතවශ්‍ය බවය. මීඩ් (1955) සඳහන් කරන ආකාරයට සෑම සමාජයක් තුළම මෙබඳු ශ්‍රම විභජනයක් දැකිය හැකිය. ගොට්ෆෙඩ්සන් තම පුද්ගල සමාජආත්ම වර්ධය පිළිබඳ න්‍යාය තුළ පවසන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා අභ්‍යන්තරීකරණය සීඝ්‍රව සිදුවනුයේ වයස අවුරුදු 3-5 අතර කාලය තුළ බවයි (කොලින්ස් සහ කෝල්ට්රරන් 1993). කවරාකාරයේ ලිංගික දිශානතියක් තුළ වුවද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුණු භූමිකාවන් හඳුනාගත හැක.

## 5. ජීව විද්‍යාත්මක ලිංගිකත්වය

ඩෙස්මන්ඩ් මොරිස් සිය සුප්‍රකට කෘතිය වන නිරුවත් වානරයා (The Naked Ape) හි සඳහන් කරනුයේ නවීන මිනිසා ලිංගික වශයෙන් යම් වික්ෂිප්ත භාවයකට පත්ව ඇත්තේ ප්‍රිමාටයකු (primate)[1] සහ මාංශ භක්ෂණය කරනා (carnivore) සත්ත්වයකු වශයෙන් ඔහුගේ හෝ ඇයගේ ජීව විද්‍යාත්මක උරුමය සහ ඔහු හෝ ඇය නියෝජනය කරනා සරු ශිෂ්ඨාචාරය අතර වන ගැටුම නිසා බවයි (මොරිස්

1997:34). මානව ලිංගිකත්වය ස්වභාවධර්මය සහ සංස්කෘතිය ඇසුරෙන් වන නිමවුමක් බව අපි සඳහන් කළෙමු. ජීව විද්‍යාත්මක වශයෙන් ගත් කල්හි මිනිසා සත්ත්ව ලෝකය තුළ අතිශයින්ම ලිංගිකවූ සත්ත්වයෙකැයි මොරිස් තව දුරටත් තර්ක කරයි.

මිනිස් ගැහැණු සත්ත්වයා හැර අන් සියළුම ක්ෂීරපායි ගැහැණු සතුන් ලිංගික ක්‍රියා සඳහා සූදානමක් දක්වන්නේ එස්ට්‍රස් (estrus) නමින් හැඳින්වෙන හෝර්මෝනමය වශයෙන් සක්‍රීය කාලය තුළදී පමණි (ආක්ස් සහ ගාස්කි 1977). තවත් ආකාරයකට පවසනවා නම්, අප විශේෂය තුළ ගැහැණු පක්ෂය ආර්ථව චක්‍රය පුරා වසර මුළුල්ලේම ලිංගික වශයෙන් සක්‍රීය වේ. මාස්ටර්ස් සහ ජොන්සන් (1970) පෙන්වා දෙන්නේ ආර්ථවහරණයෙන් (menopause) පසුව වුවද කාන්තාවන්ගේ ලිංගික අභිප්‍රේරණයෙහි සැලකිය යුතු වෙනසක් සිදු නොවන බවයි.

මානව ලිංගිකත්වය ජීවවිද්‍යාත්මක වශයෙන්ද සුවිශේෂ බව පෙන්වාදීමට තවත්කරුණු පවතී. සුරතාන්තය (climax) ලැබීම මෙන්ම ලිංගික සංසර්ගයේදී බහු සුරතාන්ත ලැබීමේ හැකියාව මිනිස් ස්ත්‍රී පක්ෂයට ඇති සුවිශේෂ තත්ත්වයකි. මිනිසාගේ ලිංගික ක්‍රියාව සඳහා මස්තිෂ්ක භාහිකයෙහි (cerebral cortex) මැදිහත්වීම ඉහළ මට්ටමක පවතී. සිරුරේ ප්‍රමාණයට සාපේක්ෂව විශාලතම මස්තිෂ්ක භාහිකය උරුම වන්නේද මිනිසාටය. ලිංගික ක්‍රියාවන්හි මනෝචාලක ක්‍රියාකාරකම් මස්තිෂ්ක භාහිකය මඟින් පාලනය වේ (ආක්ස් සහ ගාස්කි 1977). සියළුම ප්‍රිමාටයන් අතර විශාලතම ප්‍රජනක ඉන්ද්‍රිය (ශිෂ්ණය) පවත්නේද මිනිසාහටය. මීට අමතරව, ජීවවිද්‍යාත්මකව සලකා බලතොත් මිනිසාගේ ශරීර සැකැස්ම සහ ක්‍රියාකාරකම් ලිංගික වශයෙන් උපරිම තෘප්තියක් ඇති කරනු පිණිස අන්කවර සත්ත්ව විශේෂයක හෝ නොදැකිය හැකි අයුරින් පරිණාමයට ලක්ව ඇත. ලිංගික හැසිරීමකදී උපරිම ශරීර ස්පර්ශයකට ඉඩ සැලසෙන පරිදි අන් සතුනට සාපේක්ෂව ශාරීරික රෝම ඉවත්ව ගොස් ඇත. වෙනත් බොහෝ විශේෂයන් තුළ ලිංගික සංසර්ගයේදී දෙපාර්ශවයේ මුහුණු එකිනෙකා නොදකින මුත්, ලිංගික ඉරියව්වෙහි ඇති වෙනස් වීම් නිසා මිනිසා සුවිශේෂ වේ (මොරිස් 1967). ෆෝඩ් සහ බීච් (1951) යන මානව විද්‍යාඥයන් නිගමනය කරනුයේ ශරීරාභ්‍යන්තරයෙන් වන හෝර්මෝනමය බලපෑම අභිබවා මිනිස් ලිංගික අභිප්‍රේරණය සහ චර්යාව උගත් හැසිරීමක් වන බවයි. කෙසේ වෙතත්, මානව ලිංගිකත්වය පසුපස ඇති ජීවවිද්‍යාත්මක සාධක බොහෝ සේ සංකීර්ණ බවද අප වටහාගත යුතුය.

ජීව විද්‍යාත්මක ලිංගිකත්වය පවා සමාජ සංස්කෘතික සාධක මගින් වෙනස් කොට පවත්නේ යැයි පැවසීම අතිශෝක්තියක් නොවන්නේය. මිනිසාගේ ලිංගික පරිණතභාවය ඇතිවීම ජානමය සාධක, පරිසර තත්ත්ව සහ සංස්කෘතිකමය කරුණු මත රඳා පවතී. උදාහරණයක් ලෙස ගතහොත්, කාර්මික රටවල යෞවනෝදය (puberty) සංවර්ධනයවන රටවලට සාපේක්ෂව කලින් උදාවේ (ස්පෙයින්බර්ග් 1993: 35-37). ඒ සඳහා බලපාන සංස්කෘතික කරුණු පවතී.

## 6. මනෝවිද්‍යාත්මක ලිංගිකත්වය

ලිංගිකත්වය බොහෝ සෙයින්ම මනෝවිද්‍යාත්මක වූ ප්‍රපංචයකි. අප එය සරළ මනෝවිද්‍යාත්මක සත්‍යයක් ඇසුරෙන් වටහා ගනිමු. ලිංගික ආශාව මනස සහ සිරුර ඇසුරෙන් ජනිත වන අනෙකුත් අභිප්‍රේරණයන් (motivation) ගෙන් පැහැදිලිව වෙනස් වේ. අප කුසගින්න, නින්ද හෝ පිපාසය පිණිසවන අභිප්‍රේරණ සලකතොත් ඒවා ශරීරය තුළ ශක්තිය වැයවීමට හේතුවක් වන අතර, ලිංගිකව නොහැසිරීම පුද්ගල ජීවිතය නැසීයාමට හේතුවක්ද නොවේ. අනෙක් අතට ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යාව තුළ දැක්වෙන ආකාරයට ලිංගික ආශාව ජීවය පවත්වා ගැනීම පිණිස මනෝකායික වේගයෙන් පැන නගිනා ජෛව ආශයකි (life instinct) (කොලින්ස් සහ කෝල්ට්‍රන් 1993). කෙසේ වෙතත්, කුසගින්න, පිපාසය මෙන්ම ලිංගික අභිප්‍රේරණයද මොලයෙහි හයිපොතැලමසය හා සබැඳි පාලනය වේ. ලිංගික අභිප්‍රේරණය සඳහා ශරීර හොර්මෝන ස්ත්‍රී පුරුෂ හෝර්මෝන ලෙස යම් බෙදීමකට ලක් කළ හැක. ඊස්ට්‍රජන් (Estrogen) සහ ප්‍රොජෙස්ටෙරොන් (Progesterone) ස්ත්‍රී හෝර්මෝන වන අතර ඇන්ඩ්‍රජන් (Androgen) සහ ටෙස්ටොස්ටෙරෝන් (Testosterone) පුරුෂ හෝර්මෝන ලෙස ගැනේ. පිළිවෙලින් ඩිම්භකෝෂ සහ වෘෂණකෝෂ මෙම හෝර්මෝන නිපදවීම හයිපොතැලමසයේ බලපෑම මත පිටියුටරි ග්‍රන්ථිය මගින් නිකුත්කරනා රසායනික පණිවුඩ අනුව සිදු කරයි. කාන්තාවන් තුළ ඉහත ස්ත්‍රී හෝර්මෝන දෙවර්ගයම අවශ්‍යය ප්‍රමාණයට වඩා අඩු විටදී පවා ලිංගික අභිප්‍රේරණය ඇතිවේ. එයට හේතුව ඇන්ඩ්‍රජන් නම් පුරුෂ හෝර්මෝනයද කාන්තා ශරීර තුළ නිපදවීමය. කෙසේ වෙතත්, ලිංගික අභිප්‍රේරණය කෙරෙහි ඇති හෝර්මෝනමය බලපෑම සලකා බලන කල මනෝවිද්‍යාව තුළ එළඹ ඇති වැදගත් නිගමනයක් වන්නේ ශරීරය තුළ ලිංගික හෝර්මෝන සංතෘප්තව පවතින කල්හි,

ඉන් ඔබ්බටත් මානව ලිංගික චර්යාව සඳහා වූ අභිප්‍රේරණය කෙරෙහි බලපාන සියල්ල හෝර්මෝනමය නොවන වෙනත් තත්ත්වයන්ය යන්නය (ආක්ස් සහ ගාස්කි 1977). මේ ඇසුරින් අපට පසක් කොට ගත හැකි සත්‍යයක් නම් මිනිසුන් සතු අනේකවිධ වූ ලිංගික චර්යා සහ ලිංගික අධිසක්‍රියභාවය හුදෙක් හොර්මෝනමය සාධක නැතහොත් ජීවවිද්‍යාත්මක සාධකයන්ට සීමාවී විග්‍රහ කළ නොහැකි බවයි.

මෑතකදී සිදුකළ වැදගත් සොයාගැනීමක් නම් ලිංගික චර්යාව විසින්ම අනාගත ලිංගික චර්යාව සහ ක්‍රියාකාරකම් තීරණය සඳහා වැදගත්වන මොළයෙහි න්‍යුරෝන වෙනස්කරනා බවයි (බ්‍රිඩ්ලව් 1998). මෙම පර්යේෂණයන්ගෙන් හෙලිව ඇති සත්‍යයක් නම් ගැහැණුන් සහ පිරිමින් එමෙන්ම, විශමලිංගිකයන් සහ සමලිංගිකයන් අතරද මොළයේ න්‍යුරෝන සැකැස්ම ආශ්‍රිත වෙනස්කම් ඇති බවයි. නමුත් මේ තුළ සැඟව ඇති සියුම් සත්‍ය පුදුම එළවන සුළුය. එනම් මානව සමාජය තුළ සංස්කෘතික හේතු මත සිදුවන චර්යාව සහ අත්දැකීම් මිනිසා මානසික වශයෙන් මෙන්ම ජීවවිද්‍යාත්මක වශයෙන් වෙනසකට නැතහොත් පරිණාමයට ලක්කරනා බවයි.

## 7. ලිංගික චර්යාව

ලිංගික චර්යාව ද ලිංගිකත්වයෙහි ප්‍රධාන උපකොටසකි. සිග්මන් ෆ්‍රොයිඩ් තම මනෝවිශ්ලේශණවාදී ප්‍රවේශය තුළ මානව ලිංගිකත්වයෙහි ස්වභාවය කියාපෑමට 'Polymorphously Perverse' යන වාක්‍ය ඛණ්ඩය යොදා ගනී. මෙහි අරුත වනුයේ සාමාජීය වශයෙන් සදාචාරාත්මක ලෙස අනුමත කරන සීමාවෙන් පරිභාහිරව ලිංගික තෘප්තිය සඳහා මිනිසාහට ඇති හැකියාවයි (හෝක්ස් 1996). අනෙක් අතට මිනිසුන් තුළ පවත්නා විවිධ වූ ලිංගික අභිරුචි මේ වදන තුළින් හැඟවේ. නීතියට පටහැනි නැත්නම් සදාචාරමය නොවන ලෙස ලේබල් කරනා තත්වයක පවා මිනිසුන් මෙම රුචිකත්ව හඹායන බව සමාජ විද්‍යාඥයෝ පවසති (ගිඩ්න්ස් 1997: 100). වත්මන් සමාජ තුළ ලිංගිකත්වය වඩාත් පැහැදිළි තෝරාගැනීමක් බවට පත්ව ඇත.

ලිංගික චර්යාව සඳහා විකිපීඩියා ශබ්දකෝෂය සපයන අර්ථකතනය තුළ ලිංගික ක්‍රියා සඳහා ඇතිවන අන්තර් පුද්ගල සබඳතා, කායික මානසික වශයෙන් වන කුලුපග බව සහ ලිංගික එක්වීම යන උපාං. ඇතුළත්ය (http://en.wikipedia.org/wiki/sexial_behaviour : 15.06.2008). ලොව විවිධ සංස්කෘති අධ්‍යයනය කරන

කල්හි විශාල ප්‍රරාසයක් පුරා විහිදුනු ලිංගික චර්යා පවත්නා බව තහවුරු වේ. ලිංගික තෘප්තිය පතා පුද්ගලයා තම ශරීරය වෙතටත් (autoeroticism) අන්‍ය ශරීරයන් වෙතටත් (socio sexual behavior) ඇලුම් කළ හැක. පළමු ස්වරූපය වන ස්වයංවින්දනය මනෝලිංගික වර්ධනයෙහි එක්තරා පෙර සලකුණක් ලෙසද ඇතැම් අය සලකති (බ්‍රිස්ටෝ 1997:35). ජනිතයන් බිහිකිරීම සඳහා සරුබව ලබා ගැනීමට පෙර සිටම ළමාවිය තුළ ලිංගික ක්‍රීඩාවෙහි නිරත වීම බොහෝ ක්ෂීරපායී සතුන් සතු ලක්ෂණයකි. එක්සත් ජනපදය තුළ වසර 1950 දී පවා 92% පිරිමි සහ 54% කාන්තාවන් ස්වයංවින්දනයෙහි යෙදුනු බව වාර්ථාවේ (ෆොඩ් සහ බීච් 1951). විසිවන සියවසෙහි මැද භාගයෙහි පල වූ සුප්‍රසිද්ධ කින්සි වාර්ථාවට (Kinsey Report) අනුව 90% පමණ පිරිමි මෙම චර්යාවෙහි යෙදේ (බිලිංටන් 1998:92). ස්වයංවින්දනය ආශ්‍රිතව පවතින මිත්‍යා මතයක් වන්නේ එය හානිකර බවය. එය සනාථ කිරීමට ප්‍රමාණවත් තරම් සාක්ෂි නොමැති අතර එය ලිංගික ආතතිය මුදා හැරීමේ හානිකර නොවන චර්යාවක් ලෙස සැලකේ (බ්‍රිතාන්‍ය විශ්ව කෝෂය 1991).

පුද්ගලයෙකු වෙනත් සහකරුවකු (සහකරුවන්) සමග ඇතිකරගන්නා චර්යාව මිනිස් සමාජීය ලිංගික චර්යාවයි. මෙම චර්යාවට අයත් බොහෝ ක්‍රියාකාරකම් ලිංගික සංසර්ගයට පෙර සිදුවේ. සිපගැනීම ඈ මෙබඳු බොහෝ චර්යාව සර්ව විශ්වීය වශයෙන් සමාජගතව පවතී.

ලිංගික චර්යා සලකන විට ඒවා විවාහය තුළ හෝ ඉන් පරිබාහිරව විෂම ලිංගිකයන්ට හෝ සමාන ලිංගයන්ට අයත් පුද්ගලයන්, ස්ථිර හෝ අහඹු පදනමක් මත සිදුකළ හැක. අප පෙර සඳහන් කළ ලිංගික මාර්ගෝපදේශක (sexual scripts) මතින් ඒ ඒ සංස්කෘතික පසුබිමට අනුරූපව ලිංගික චර්යාව කෙසේ විය යුතුදැයි අත් වැලක් සපයයි. අතිවිශාල වූ ලිංගික චර්යා සමූහයක් අතරින් හුදු අවබෝධය පිණිස උදාහරණ සපයන්නේ නම් සිපගැනීම, කාමුක සම්භාහනය, යෝනි මාර්ගික, මුඛ හෝ ගුධ මාර්ගික සංසර්ගය ආදිය දැක්විය හැක. මේ අතර ඇතැම් චර්යා ඇතැම් පසුබිම් තුළ අඩු හෝ වැඩි වශයෙන් අපගාමීත්වයේ ලා සලකයි. කෙසේවෙතත්, බොහෝ අපගාමී ලිංගික චර්යා අතුරින් කිහිපයක් ලෙස අර්චනකාමය හෙවත් පූජා ලාංචන කාමය (fetishism), පරපීඩාකාමුකත්වය (sadism) හෝ ස්වපීඩා කාමුකත්වය (masochism) සඳහන් කළ හැක. මෙහිදී සලකා බැලිය යුතු තවත් වැදගත් කරුණක් වන්නේ ලිංගිකව සම්ප්‍රේෂනය වන රෝග (STI) හා සබැඳි වත්මන් අභියෝග

හමුවේ ඉතා පුළුල් පරාසයක් ලිංගික ක්‍රියා වැඩි අවදානම්, අඩු අවදානම් සහ සුරක්ෂිත ලිංගික ක්‍රියා වශයෙන් වර්ග කොට පැවතීමය. මේ ඇසුරෙන් ගම්‍ය වන්නා වූ තවත් සත්‍යයක් වනුයේ බොහෝ මිනිස් ලිංගික චර්යා ප්‍රජනනය යන අරමුණ සඳහාම නොවන අතර, තෘප්තිය සඳහා යම් ප්‍රබල මාධ්‍යයක් කොට පවතින බවයි. සමාජ විද්‍යාත්මක දෘෂ්ඨියකින් විමසන කළ මෙහිදී ස්වභාවික සහ අස්වාභාවික චර්යා පිළිබඳ වාදය පදනම් විරහිත වන්නේ එක් සංස්කෘතික පසුබිමක ස්වභාවික හෝ අස්වාභාවික ලෙස ඇති බෙදීම තවත් පසුබිමකට අනුරූපව වෙනස් වීම නිසාය. ප්‍රජනනය පිණිස පමණක් වන චර්යාව ස්වාභාවික ලෙස සැලකේ නම් අධිකතර ප්‍රජනනය වළක්වා ගැනීම සඳහා ඇති චර්යාද ස්වභාවධර්මයේම නීතී හා ගැලපේ. කෙසේ වෙතත් මේ සියල්ල සමාජ සම්මුති බව ඉතා පැහැදිළිය.

## 8. ලිංගික දිශානතිය සහ අනන්‍යතාවය

ඉතිහාසය පුරා දිස්වූ මානව ලිංගික ක්‍රියාකාරකම් හා අත්දැකීම්වල විවිධ බව ඇමරිකාවේ සහ බටහිර යුරෝපයේ ලිංගික විප්ලවයක් ඇති වී යැයි සැලකෙන 1960 දශකයෙන් පසු වර්ධනය විය. තවදුරටත් වර්ධනය වන ලිංගික ප්‍රකාශනය පිළිබඳ ලිබරල් චින්තාව, උපත්පාලනය වැනි තාක්‍ෂණික ප්‍රගමන, ප්‍රබල මාධ්‍ය ජාල හරහා ඉස්මතු වන ජනප්‍රිය සංස්කෘතිකාංගයන්හි බලපෑම, වියැකීයන සාම්ප්‍රදායික අනන්‍යතාවන් ආදිය හමුවේ පුද්ගලයා තම ජීවිතයට සහ ක්‍රියාකාරකමවලට අරුතක් සොයනු පිණිස නව අනන්‍යතාවයන් කෙරෙහි පොළඹවා ඇත. ගෝලීයකරණ ප්‍රවාහය තුළ ඉස්මතුවන සංස්කෘතික සම්මිශ්‍රණයෙහි අවරගැස්මක් (backlash) ලෙස ඉස්මතු වන්නේ විවිධාකාරයෙන් බෙදුනු පුද්ගල සහ සංස්කෘතික අනන්‍යතා බිහිවීමය (ට්‍රෙසී සහ ටිම් 1999: 117). මේ පසුබිම මත විවිධ ලිංගික දිශානති (sexual orientation) සහ ලිංගික අනන්‍යතා (sexual identity) බිහිවී ඇත. මෙම සංකල්ප ද ලිංගිකත්වයෙහි උපාංගයෝ වෙති.

ලිංගික දිශානතිය පුද්ගල ලිංගික අනන්‍යතාවයෙහි වැදගත් පැතිකඩකි. පවත්නා ලිංගික දිශානතීන්ට උදාහරණ ලෙස විෂම ලිංගිකත්වය, සමලිංගිකත්වය, ද්විලිංගිකත්වය (bisexuality), ආදේශ ලිංගිකත්වය (transexuality) සහ අලිංගිකත්වය (asexuality) දැක්විය හැක.

පුද්ගලයා විවිධ ලිංගික දිශානති කරා යොමුවීමට බලපාන කරුණු ජීව විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක සහ පරිසරමය පර්යාලෝක හරහා විද්‍යාත්මක පර්යේෂණයට ලක්කොට ඇත. පවත්නා දැනුම අනුව ලිංගික දිශානතිය ජානමය, හෝර්මෝනමය සහ පුද්ගලයා තම සමාජ-සංස්කෘතික පරිසරය අත්දකින ආකාරය යන කරුණු මත තීරණයවන බව පැවසිය හැක. අනෙක් අතට ලිංගික දිශානති ඉහත හේතු සංකලනයක් මතින් මිස එක් හේතුවක් මතින් පමණක් තීරණය වන බවද පැවසිය නොහැක. කින්සි අධ්‍යයනයන් තුළින්ද පැහැදිලිව පෙනීයන්නේ ලිංගික දිශානතිය පුද්ගල ජීවිතකාලය තුළ වෙනස්විය හැකි ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් සංකල්පයක් බවය (මැක් කැමන් 1998).

ලිංගික දිශානතිය සහ අනන්‍යතාව අතර ඇති සංකල්පීය වෙනසද මෙහිදී හඳුනාගත යුතුවේ. ලිංගික දිශානතිය අනුව ලිංගික චර්යාව බෙදාවෙන්කළ නොහැක. මන්ද යත් එක් ලිංගික දිශානතියට සීමාවූ ලිංගික චර්යාවන් නොමැතිවීමය. තවත් ආකාරයකට පවසතොත්, විවිධ වූ ලිංගික චර්යා විවිධ වූ ලිංගික දිශානති තුළ පැවතීමේ හැකියාව මෙන්ම නොහැකියාවද පවතී. උදාහරණයක් ගන්නේනම් සිපගැනීම ඕනෑම ලිංගික දිශානතියක් තුළ චර්යාවක් ලෙස පැවතිය හැක. පුද්ගලයා ලිංගික වශයෙන් කවර වස්තූන් වෙත ආකර්ෂණය වන්නේද යන්න සහ ඊට අදාල චර්යාව මතින් පුද්ගල ලිංගික දිශානතිය වටහාගත යුතුය (ක්‍රෝගර් 2000). අප පුද්ගලයාගේ ලිංගික සමාජ අනන්‍යාවය (sexual identity) වශයෙන් හඳුන්වන්නේ පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා සහ පුද්ගල ලිංගික දිශානතිය පිළිබඳව (ක්‍රෝගර් 2000: 48-69) පුද්ගලයා තමාගැන සිතන ආකාරයත්, අන්‍යයන් තමා ගැන සිතන්නේ යැයි විශ්වාස කරන දෑ සහ සැබැවින්ම ලිංගික වශයෙන් අන්‍යයන්ට සාපේක්ෂව තමන් කවුරුන්ද යන පුද්ගල හැඟීම් මාත්‍රයයි.

මෙහිදී අවසාන වශයෙන් අප උත්සාහ දරන්නේ ලිංගික දිශානති කිහිපයක් පිළිබඳව විමසීමටය. විරුද්ධ ලිංගිකයන් වෙත ආකර්ෂණය වීම විවිධ ලිංගික දිශානති අතර ප්‍රමුඛ බුද්ධි අධිකාරමය (hegemony) තත්ත්වයක් ලබා ඇත. අප පෙර සඳහන් කළ පරිදි බහුතරයක් සංස්කෘති එය සම්පූර්ණ ස්වාභාවික තත්ත්වය ලෙස සලකා තම බලව්‍යුහය මගින් අනිවාර්ය විශම ලිංගිකත්වයක් ලෙස පවත්වාගෙන යයි (බිල්ටන් ඇතුළු පිරිස 1996: 225). ඇතැම් අතිපාරිශෝධනවාදී කාන්තාවාදී පිරිස් හඬ නගන පරිදි කාන්තාවන්ට පුරුෂ මූලිකත්වයට එරෙහිව විමුක්තිය සලසාගැනීමට ඇති මූලික බාධාව විශම ලිංගිකත්වය වේ (වීක්ස් 1986:83). මානව විද්‍යාව තුළ පසක්වන

කරුණක් නම් විවිධ සමාජ තුළ විශම ලිංගිකත්වයට ඇති ඉඩකඩ අන් ලිංගික දිශානති මෙන්ම වෙනස්වන බවරැය (එම්බර් සහ එම්බර් 1993).

මිනිසුන් විවිධ දිශනති මෙන්ම අනන්‍යතා කරා එළැඹීම පසුපස ඇති බහුවිධවූ කරුණු විද්‍යාත්මක පර්යේෂණයන් හරහා සම්පූර්ණයෙන් හෙලිකර ගැනීමට අපොහොසත්ව ඇත. කෙසේ වෙතත් ජීව විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක මෙන්ම භෞතික සහ සමාජ සංස්කෘතික පරිසර තත්ත්ව සංකලනයක් මේ සඳහා හේතුවන බව කිව හැක. ප්‍රධානවූ විශම ලිංගිකත්වයට අමතරව වන සුළුතර ලිංගික දිශානතීන් පිළිබඳව විමසීම ද වැදගත්වේ.

සමලිංගිකත්වය ලොව විවිධ සමාජ තුළ විවිධ කාලපරාස් තුළ අඩු හෝ වැඩි සමාජ පිළිගැනීමක් සහිතව පැවති බවට සාක්ෂි පවති. පැරණි ග්‍රීසිය රෝමය, චීනය සහ ගෝත්‍රික සමාජ ගණනාවක් තුළ සමලිංගික සබඳතා ආයතන ගත ස්වරූපයකින් සමාජ පිළිගැනීමක් සහිතව පැවත ඇත (එම්බර් සහ එම්බර් 1993, බ්‍රිතාන්‍ය විශ්වකෝෂය 1991). නමුත් මෑත කාලීනව ජීවන ශෛලියක් (life style) ලෙස එය ඉස්මතු වනුයේ 1950 සහ 1960 දශක තුළ ඇමරිකා එක්සත් ජනපදයෙහි ඇතැම් ප්‍රාන්ත සහ ඇතැම් බටහිර යුරෝපීය සමාජ තුළය. 20 වන සියවසේදී ඉහත සමාජ තුළ සමලිංගික විමුක්ති ව්‍යාපාර බිහිවෙයි (වික්ස් 1986: 73). මධ්‍යකාලීන යුගයේ ඇතැම් දේවධර්මවාදී සදාචාර පද්ධති තුළ සමලිංගිකයන්ට මරණ දඬුවම පැනවූ අවස්ථාව ද වාර්තා වේ. කෙසේ වෙතත් 1965 වසරේදී ඇමෙරිකානු මනෝවිද්‍යා සංගමය (American Psychological Association) මගින් සමලිංගිකත්වය මානසික රෝග ලැයිස්තුවෙන් ඉවත් කරන ලදී. විසිවන සියවසෙහි මැද භාගයෙහි පල වූ සුප්‍රසිද්ධ කින්සි වාර්ථාව මගින් හෙළිවූයේ ඇමෙරිකා එක්සත් ජනපදය තුළ ජනගහණයෙන් 37% සමලිංගික වශයෙන් අත්දැකීම් ලබා ඇති බවයි. එසේ නමුදු මේ සියළු පිරිස සමලිංගික අනන්‍යතාවයක් ඇති පුද්ගලයන් සේ සැලකීම සාවද්‍යවේ. සමලිංගික දිශානතිය තුළ රැදෙනුයේ ජනගහණයෙන් 5% -10% අතර පිරිසක් බව හෙළි වී ඇත (ප්ලෙඩ්මන් 1992). ජානමය හෝ හෝර්මෝනමය සාධක මගින් මෙබඳු දිශානතියකට පුද්ගලයා යොමුවන බවට පැහැදිළි සාක්ෂි නොමැති මුත් මව්කුස තුළ මුල් කලලරූපී අවස්ථාවෙහි ඇතිවන හෝර්මෝනමය සංකූලතාවයක් කරණකොට මොළය තුළ ජීව විද්‍යාත්මකව ඇතිවන ස්නායුමය තත්ත්වයක් මත සමලිංගික බව තීරණය කෙරෙන බව එක් මතයකි (http://en.wikipedia.org/wiki/homosexuality # parental_hormonal_theory).

මෙයට අමතරව බයිබර්ගේ මතය වූයේ වුවමනාවට වඩා විපරම් කරණා මවක් සහ දුරස්ථ සහ සතුරු ස්වරූපයක් ගත් පියෙකු සහිත පවුල් පරිසරය මේ සඳහා හේතුවන බවය (බ්‍රිතාන්‍ය විශ්වකෝෂය 1991). ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ පුද්ගල පෞරුෂ වර්ධනය පිළිබඳ න්‍යායට අනුව තෙවන වර්ධනීය අවධිය වන ශෛෂ්ණ අවධිය (phallic stage) තුළ පුද්ගලයා සංකාවට පත්වීම මෙයට හේතු විය හැකි බවය ෆ්‍රොයිඩ් ට අනුව සමලිංගිකත්වය රෝගයක් නොවන අතර ලිංගික වශයෙන් වූ වෙනස් තත්වයකි (උපුටා දක්වන්නේ, වීක්ස් 1986:73). නමුත් එමෙහි සමාජ සංස්කෘතික පීඩනය හමුවේ ආතතිය, විශාදිය සහ සියදිවි නසාගැනීමේ තත්වයන්ට පවා සමලිංගික පුද්ගලයන් යොමුවේ (සැන්ට්‍රොක් 1996).

ද්වි ලිංගිකත්වය (bisexuality) යනු සමාන සහ විරුද්ධ ලිංගික පුද්ගලයන් වෙත ලිංගිකව ආකර්ෂණය වීමය. ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ අදහස්වලට අනුව උපතේදීම සහ මුල් බිළිඳු අවධිය තුළ පුද්ගලයා තුළ ද්වි ලිංගික ස්වභාවයක් පවතින අතර සහජවම යටත්කරගන්නා සුළු (active) හෝ යටත්වෙන සුළු (passive) ලක්ෂණ නොදරයි (උපුටා දක්වන්නේ, බ්‍රිස්ටෝ 1997: 81). සංඛ්‍යාත්මක වශයෙන් ගත්කළ කුඩා සුළුතරයක් මෙම ලිංගික දිශානතියට යොමුවේ.

ඉහත දිශානතීන්ට අමතරව අලිංගිකත්වය (asexuality) ද එක්තරා ලිංගික දිශානතියක් කොට සැලකීමෙහි වරදක් නොමැත. 'මින් අදහස් කරන්නේ ස්ත්‍රී පුරුෂ කිසිදු පාර්ශවයක් සඳහා ලිංගික වශයෙන් ආකර්ශනය නොවීමේ තත්වයකි. ඉතා කුඩා සුළුතරයක් නමුත් ගෝලීය ජනගහණය හා සසඳන කළ සැලකිය යුතු පිරිසක් මෙය ජීවන ශෛලියක් සේ අනුගමනය කරති.

මෙම ශාස්ත්‍රීය ලිපිය තුළ අප හුදෙක් උත්සාහ ගත්තේ බහුවිධ වූ පැතිකඩ සහිත ලිංගිකත්වය සහ ලිංගිකත්වය සහ ලිංගික අනන්‍යතාව ආශ්‍රිත සංකල්පීය උපාංග අවබෝධය සඳහා අත්වැලක් සැපයීමටය. ලිංගිකත්වය හා සබැඳි සංකල්ප ලෙස ලිංගික අනන්‍යතාව, ලිංගික දිශානතිය සහ ලිංගික චර්යාව පිළිබඳ විග්‍රහයක් සමාජ විද්‍යාත්මක, මානව විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක මෙන්ම ජීව විද්‍යාත්මක පර්යාලෝක මගින් සිදුවිය. ලිංගිකත්වය ජීව විද්‍යාත්මක පදනමක් මත පිහිටි සමාජ සංස්කෘතික නිර්මාණයක් බව සනාථ කරනු පිණිස මෙම ලේඛණය තුළ කරුණු සම්පිණ්ඩනය විය.

## ආශ්‍රිත ග්‍රන්ථ:


Arkes, R.H. & Garske, P.J, 1977, Psychological Theories of Motivation, Monterey, Brooks/Cole Publishing Company.

Baron, Robert A. & Byrne,Donn,1995, Social Psychology, New Delhi, Prentice-Hall of India Pvt Ltd.

Billington, Rosamund,1988, Exploring Self and Society, Houndmills, MACMILLAN PRESS Ltd.

Bilton, Tony, et al,1996, Introductory Sociology, London, MACMILLAN PRESS LTD.

Breedlove, Marc, 1988, 'Sexual activity may explain differences in sexual identity, study suggests', American Psychological Association, Volume 29,No.2.February, http://www.apa.org/monitor/feb98/sex.html, 21.11.2007.

Bristow,Joseph,1997,Sexuality, London, Routledge.

Collins, R & Coltrane, S, 1991, Sociology of Marriage and Family, Chicago, Nelson-Hall Inc.

Ember, R.C. & Ember, M, 1993, Anthoropology, New Delhi, Prentice-Hall of India Private Ltd.

Encyclopedia Britannica, 1991, Volume 27, Chicago, Encyclopedia Britanica Inc.

Feldman, Roberts,1992, Elements of Psychology, New York,McGraw Hill, Inc.

Ford, S.C & Beach, F.A, 1951, Patterns of Sexual Behavior, USA,Haper & Brothers, Publishers and Paul B. Hoeber, Inc.

Foucault, Michel,1979,The History of Sexuality,Volume1,London,Robert Hurley.

Foucault. Miche, 1977, Discipline and Punish. The Birth of the Prison, Harmondsworth, Penguin.

Foucault, Michel,1984, The care of self. The History of Sexuality, London,Penguin Books.

Giddens, Anthony,1997,Sociology, Oxford , Blackwell Publishers LTD.

Gombrich, Richard & Obeyesekere, Gananath,1988, Buddhism Transformed: Religious Change in Sri Lanka. Delhi, Motilal Banarsidass Publishers Pvt Ltd.

Hawkes, G. 1996, A Sociology of Sex and Sexuality, Maidenhead,Open University Press,

Knox, Robert,1989, An historical Relations of the Island Ceylon, Dehiwala,Thisara Prakashakayo Ltd.

Kroger, Jane,2000, Identity Development, Thousand Oaks, Sage Publications, Inc.

MaCammon, S. 1998, Making Choices in Sexuality, Pacificgrove,Brooks/Cole Publishing Company,

Masters, H & Johanson, V.E,1970, The Pleasure Bond, Boston, Little Brown and Company.

Mead, Margaret,1935, Sex and Temperament in Three Primitive Societies, New York, New American Library.

Mead, Margaret, 1955, Male and Female, New York, The New American Library of World Literature, Inc.

Morris, Desmond, 1967, The Naked Ape, London, Jonathan Cape Ltd.

Santrock, J.W, 1996, Adolescence,Madison, Brown and Benchmark Publishers.

Steel , liz & Kidd, Warren, 2001, The Family, New York, PALGRAVE.

Steinberg, Laurence, 1993, Adolescence, New York, McGraw Hill Inc.

Tracey, Skelton & Allen, Tim, 1999, Culture and Global Change, London, Routledge.

Weeks, Jeffery, 1986, Sexuality, London, Routledge.

අමරසිංහ ඇතුළු පිරිස, "2001" සමාජ විද්‍යාව පිළිබඳ ශබ්දකෝෂය, මුල්ලේරියාව, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය,

http://en.wikipedia.org/wiki/Sexuality, 2007.07.19

http://en.wikipedia.org/wiki/homosexuality # parental_hormonal_theory, 2007.07.19.